**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන-3 ව්‍යාපෘතිය - 2019**

-----------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 3 ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව සමහ 2016 අගෝස්තු 11 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමහ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(l) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරික්ෂන මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

-----------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 03 ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගිවිසුම අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වනුයේ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීම හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 03 ක් යටතේ ක්‍රියාත්මක වේ. ඒවා නම් ව්‍යාපෘති සංවර්ධන ආධාරක උපදේශණ කොන්ත්‍රාත්තුව, ව්‍යාපෘති 01 සඳහා අතිරේක මුදල් සැපයීම සහ ව්‍යාපෘති - 02 සඳහා අතිරේක මුදල් සැපයීම වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 29,642.60 කට සමාන එජඩො මිලියන 228.02 ක් වූ අතර ඉන් රු.මිලියන 15,990 කට සමාන එජඩො මිලියන 123 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 650 කට සමාන එජඩො මිලියන 05 ක් ආසියානු සංවර්ධන අරමුදලේ විශේෂ අරමුදල් සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඊට අමතරව, රු.මිලියන 7,742.80 කට සමාන එජඩො. මිලියන 59.56 ක් යුරෝපීය ආයෝජන බැංකුව මඟින් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 5,259.8 කට සමාන එජඩො මිලියන 40.46 ක් ශ්‍රී ලංකා රජය විසින් දායකවීමට අපේක්ෂා කර තිබුණි. තවද වැඩසටහන් ව්‍යාපෘති - 03 මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 7,231.90 කට සමාන එජඩො මිලියන 55.63 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 22,410.70 කට සමාන එජඩො මිලියන 172.39 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ව්‍යාපෘති - 03 හි කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන් ව්‍යාපෘති - 03 හි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 ජුනි 30 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
වැඩසටහන වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| ණය ලබා දෙන ආයතනය විසින් අයකර ගත් එකතුව රු. මිලියන 165.71 කට සමාන එජඩො 973,339.44 ක් වූ බැදීම් ගාස්තු සහ පොලීය, කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාවට නංවන ලද මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - II කොටසෙන් වෙන් කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | 165.71 | පිළිවෙලින් පොලී සහ බැදීම් ගාස්තු ප්‍රමාණයෙන් ණය වටිනාකම අඩුවෙන් දැක්වීම. | ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් භාණ්ඩාගාරය වෙත ගෙවන ලද ණය පොලිය අඩංගු වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් අයකරන ණය පොලිය ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ගිණුම තුළ සටහන් කර නොතිබුණි. අතිරේක සාමාන්‍යාධිකාරී මූල්‍ය ගේ උපදෙස් පරිදි මණ්ඩලයේ පවත්වාගෙන යනු ලබන ගිණුම් තුළ ඇති ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුලත් කිරීමේ අරමුණින් ව්‍යාපෘති කාර්යාලය විසින් මෙම ක්‍රියාවලිය අනුගමනය කර තිබුණි. කෙසේ වෙතත් එම ආසියානු සංවර්ධන බැංකු ණය පොළිය සටහන් අංක 11 යටතේ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශණ වල සටහනක් වශයෙන් දක්වා තිබුණි. මණ්ඩලය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ අත්සන් කරන ලද උපණය ගිවිසුම අනුව බැදීම් ගාස්තු හා ADB ණය සඳහා පොළිය භාණ්ඩාගාරය විසින් ගෙවිය යුතු බව තවදුරටත් දක්වා තිබුණු අතර එම උපණය ගිවිසුම මත පොළිය භාණ්ඩාගාරය වෙත ගෙවීමට මණ්ඩලය වගකීමට බැදී සිටියි.<br>මෙම තත්වය මත ණය ගිවිසුම් මත වන බැදීම් ගාස්තු හා පොළිය මණ්ඩලය විසින් වාර්ථා නොකරන අතර භාණ්ඩාගාරය විසින් ජාතික ගිණුම් වල වියදමක් ලෙස මෙම ණය පොළිය හා බැදීම් ගාස්තු වාර්ථා කරනු ලැබේ. | ණය දෙන ආයතනය විසින් අයකරගන්නා ලද අදාල පිරිවැය වර්ෂය අවසානයේදී උපයෝජනය කරන ලද ණය ප්‍රමාණය පෙන්වීමට හැකිවන පරිදි මූල්‍ය ප්‍රකාශණ වලට ඇතුලත් කළ යුතු වේ. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ආරම්භ කොට මාස 38 ක් ඉක්ම ගියද සුවිශේෂී කාර්යසාධනයක් දක්නට නොලැබුණු අතර ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති අංක 01 හා ව්‍යාපෘති අංක 2 සඳහා අතිරේක අරමුදල් සැපයුවද 2019 දෙසැම්බර් 31 දක්වා එය උපයෝජනය කර නොතිබුණි. පහත කරුණු නිරීක්ෂණය වේ.

**2019 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය**

| සංරචක/උපසංරචක | තනි කොන්ත්‍රාත්තු සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් සංඛ්‍යාව | ප්‍රදානය කිරීමට අපේක්ෂිත කොන්ත්‍රාත් සංඛ්‍යාව | නිම කළ කොන්ත්‍රාත් සංඛ්‍යාව | විගණන නිරීක්ෂන | බලපෑම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති සංවර්ධන ආධාරක කොන්ත්‍රාත්තු | | | | | ව්‍යාපෘතිය නිම කිරීමේ ප්‍රමාදය | ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යෑම හා ව්‍යාපෘති කාලය දීර්ඝ වීමේ හැකියාව පැවතීම | ඉදිරි ව්‍යාපෘති අවශ්‍යතාව අනුව මෙම වර්ෂය තුල තවත් උපදේශණ කොන්ත්‍රාත්තු හා භාණ්ඩ හා වැඩ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට නියමිතය. | තනි පුද්ගල කොන්ත්‍රාත්තු සැලසුම්කල පරිදි ප්‍රදානය කිරීමට පියවර ගත යුතුය. |
| (1) උපදේශණ කොන්ත්‍රාත් | 15 | 08 | 07 | 01 | | | | |
| (ii) භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් | 28 | 14 | 14 | 13 | | | | |
| ව්‍යාපෘති 01 සඳහා අතිරේක මූල්‍යනය | _ | _ | _ | _ | | | | |
| ව්‍යාපෘති 02 සඳහා අතිරේක මූල්‍යනය | _ | _ | _ | _ | | | | |

## 3.2 ඌණ උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | වැඩ සටහන් ව්‍යාපෘති 03 හි ප්‍රධාන පරමාර්ථය වනුයේ ජල සැපයුම් පද්ධතිය පුනරුත්ථාපනය කිරීම හා පුළුල් කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පරතරය සැපයීමයි (අධියර 1 සහ අධියර 2 සඳහා) කෙසේ වෙතත් 2019 දෙසැම්බර් 31 දින වන විට ඉහත වැඩසටහන් ව්‍යාපෘති 01 සහ 02 හි සියයට 84.12 ක සහ සියයට 52.11 ක අඩු මූල්‍ය ප්‍රගතිය හේතුවෙන් ණය මුදල මඟින් අතිරේක මූල්‍ය විධිවිධාන යටතේ වෙන්කරන ලද රුපියල් මිලියන 4550 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 35 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් වැඩසටහන් ව්‍යාපෘති 03 මඟින් ප්‍රයෝජනයට ගෙන නොමැත. | ණය ගිවිසුමෙන් ඇස්තමේන්තු කළ මුදලට වඩා බැඳීම් ගාස්තු ගෙවීමට රජයට සිදුවීම. | එක්සත් ජනපද ඩොලර් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අව ප්‍රමාණය වීම නිසා අධියර 01 සහ 02 යටතේ සැලකියයුතු ඉතිරියක් අප හඳුනාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අධියර 01 හි ණය මුදල 2019 ට පෙර විය පැහැදම් කිරීමට (Disbursement) නොහැකි විය. දැන් ඉතිරිකිරීම් උපයෝජනයට හා ණය කාල සීමාව දීර්ඝ කිරීමකින් තොරව ණය ප්‍රමාණය විය පැහැදම් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ බැඳීම් ප්‍රතිශතය 100% ක් දක්වා වැඩිකර ඇත. | ව්‍යාපෘති කාලය තුළ ණය මුදල උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මුළු ණය මුදලින් රුපියල් මිලියන 390 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 03 ක් ව්‍යාපෘති සංවර්ධන ආධාරක වියදම් සඳහා වෙන්කර ඇත. කෙසේ වෙතත් මාස 44 ක් වන ව්‍යාපෘති කාලයෙන් 2019 දෙසැම්බර් 31 දිනට මාස 38 ක් ඉක්ම ගියද රුපියල් මිලියන 80.63 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 0.48 ක් එනම් සියයට 16 ක ප්‍රතිශතයක් පමණක් උපයෝජනය කොට තිබුණි. | ණය ගිවිසුමේ ඇස්තමේන්තු කළ මුදලට වඩා බැඳීම් ගාස්තු රජය විසින් ගෙවිය යුතුව තිබුණි. | නව ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා ව්‍යාපෘති සංවර්ධන ආධාරක ණය මුදල ලබාදී ඇති අතර එම මුදල සත්‍ය අවශ්‍යතාවයට අනුව භාවිතා කරනු ලැබේ. | ව්‍යාපෘති කාලය තුළ ණය මුදල උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමණාකරණය හා සම්බන්ධ නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අනුව ජලය, සනීපාරක්ෂාව සහ ජල පාද මුද්‍රණය පිළිබඳ සුවිශේෂී පළපුරුද්ද සැලකිල්ලට ගැනීමකින් තොරව ජල පාද මුද්‍රණ විශේෂඥයෙකු බඳවා ගෙන තිබුණි. | තනි උපදේශණ විශේෂඥයෙකු ඇගයීමේදී අදාල අත්දැකීම් සලකා බලා නොතිබුණි. | ජල පාද මුද්‍රණ විශේෂඥයාගේ සම්පූර්ණ අත්දැකීම් අවුරදු 11 මාස 6 ක් වේ. ඒ අනුව තෝරාගත් උපදේශක හට ලකුණු 90.85 ක් ලබා දී ඇත. (අවුරුදු 05 ට අමතරව, අවුරුදු 6.5 ක පළපුරුද්ද ජල පාද මුද්‍රණ විශේෂඥයා සතුව තිබූ අතර ඒ සඳහා ලකුණු 19.5 ක් ලබා දී ඇත.) | උපදේශකයින් බඳවා ගැනීමේදී බඳවාගැනීමේ යෝජනා ක්‍රමය දැඩි ලෙස අනුගමනය කළ යුතුය. |

## 3.4 පද්ධති සහ පාලනයන්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම, ගිවිසුම් වලට එළඹීම හා උපලේඛණ ගත අවසන් කළයුතු දිනය, අවසන් වාර්ථාවන් ඉදිරිපත් කළයුතු දිනය යනාදිය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොමැත. | නිශ්චිත ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට ව්‍යාපෘතියට හැකියාවක් තිබේද යන්න සැක සහිත වේ. | ආසියානු සංවර්ධන බැංකුවේ ආකෘතිය සහ මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන සැලස්ම සකක් කර තිබුණි. ආසියානු සංවර්ධන බැංකුවේ ආකෘතිය සහ මාර්ගෝපදේශය වෙනස් කිරීමට අපට අධිකාරියක් නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අවශ්‍යතාවන්ට අනුව ප්‍රමාණවත් තොරතුරු ඇතුලත් වන ආකාරයෙන් ප්‍රසම්පාදන සැලස්ම සකස් කළ යුතු අතර, ප්‍රසම්පාදන සැලැස්මට අදාළ අවශ්‍යතා නිසා ආසියානු සංවර්ධන බැංකු ආකෘතිය වෙනස් නොවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් නොවීය. | අභ්‍යන්තර පාලනය දුර්වලය | විගණකවරුන් විසින් ඔවුන්ගේ ව්‍යාපෘති 03 කෙටුම්පත් විගණන වාර්ථාවෙහි සඳහන් කළ විමසුම සඳහා දක්වන ලද අභ්‍යන්තර විගණකගේ ප්‍රතිචාරය කරුණාකර බලන්න | අවශ්‍යතාවන්ට අනුව අනුවර්තනය විය යුතුය. |